# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 2171635 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1585/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 15/10/2024 පැය 1420

**මාධ්‍ය නිවේදනය**

**01. මාරක රිය අනතුරක් - වැලිගම පොලිස් වසම.**

2024.10.15 වන අද දින අළුයම් කාලයේ වැලිගම පොලිස් වසමේ වැලිගම බොරාල මාර්ගයේ වැල්ලක්ක ප්‍රදේශයේදී වැලිගම දෙස සිට මුදුගමුව දෙසට ධවනය වූ යතුරපැදියක් පැදිකරුට පාලනය කර ගැනීමට නොහැකිව තාප්පයක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් පැදිකරු බරපතල තුවාල ලබා වලාන රෝහලට ඇතුලත් කිරීමේදී මිය ගොස් ඇති අතර පසු පැදිකාරිය බරපතල තුවාල හේතුවෙන් ප්‍රතිකාර සඳහා මාතර රෝහලේ දැඩිසත්කාර ඒකකයට ඇතුලත් කර ඇත.

**මරණකරු වයස අවුරුදු 24 ක් වූ වැලිගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පසු පැදිකාරිය විදේශ ජාතික කාන්තාවක් වන අතර මරණකරුගේ මෘත ශරීරය පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා මාතර රෝහලට යවා ඇත. වැලිගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. සැකකටයුතු මරණයක් සහ ගෙළ වැළලා ගැනීමක් - පානදුර දකුණ පොලිස් වසම.**

2024.10.15 වන අද දින අළුයම් කාලයේදී පානදුර දකුණ පොලිස් වසමේ ශ්‍රී මහා විහාර පාර පානදුර ප්‍රදේශයේ නිවසක් තුල කාන්තාවක් සහ පිරිමි පුද්ගලයෙකු මිය ගොස් ඇති බවට 119 මධ්‍යස්ථානයට ලද පණිවිඩයක් අනුව පානදුර දකුණ පොලිසිය විසින් විමර්ශන ආරම්භ කර ඇත.
**මරණකාරිය වයස අවුරුදු 42 ක් හා මරණකරු වයස අවුරුදු 47 ක් වන පානදුර ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

ඉහත සිද්ධිය සම්බන්ධයෙන් පානදුර දකුණ පොලිසිය විසින් සිදු කරන ලද වැඩිදුර විමර්ශනයේදී කාන්තාව නිවස තුල සැකකටයුතු ලෙස මිය ගොස් ඇති

බවත් පිරිමි පුද්ගලයා ගෙළ වැළලාගෙන මිය ගොස් සිටින බවට නිරීක්ෂණය වී ඇත. විවාහක කාන්තාවක් වන මෙම කාන්තාව කලක සිට ඉහත කුලී නිවසේ තනිව පදිංචිව සිට ඇති බවත් ගෙළ වැළලාගෙන සිටින පිරිමි පුද්ගලයාද විවාහක අයෙකු වන අතර ඔහු සමඟ අනියම් සම්බන්ධතාවයක් පවත්වාගෙන ගොස් ඇති බවට අනාවරණය වී ඇත.

මෘත ශරීර පානදුර ගරු මහේස්ත්‍රාත්තුමා විසින් මහේස්ත්‍රාත් පරීක්ෂණ පැවැත්වීමෙන් අනතුරුව පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා පානදුර දකුණ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. පානදුර දකුණ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**